**ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය - 2015**

**--------------------------------------------------------------------**

ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1973 අංක 15 දරන ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර පනතේ 14 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**-----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (**ISSAI** 1000 – 1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මතය**

මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වර්ෂය තුල මුදල් ගලාඒම සහ මුදල් ගලායාම පිළිබිඹු වන පරිදි ක්‍රියාකාරකම් හඳුනාගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල විශ්‍රාම පාරිතෝෂික රු.392,864 ක් වැඩියෙන් වෙන්කර තිබුණි.

(ඇ) සේවක අර්ථසාධක අරමුදලේ හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලේ දායකයන් ගණනය කිරීමේදී අන්තර් දීමනා හා විශේෂ දීමනා, ඉපැයීම් ලෙස සැලකීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී එම අරමුදල් සඳහා පිළිවෙලින් රු. 514,373 ක් හා රු. 77,156 ක් වැඩිපුර ගෙවා තිබුණි.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගොවිභාර අරමුදලින් 2010 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා අවස්ථා 3 කදී ලබා ගන්නා ලද රු. 2,875,000 ක් වූ ණය මුදල සමාලෝචිත වර්ෂය තුල ගෙවා අවසන් කළ යුතු නමුත් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් රු. 2,687,500 ක් ගෙවිය යුතුව පැවතුණි.

(ආ) 2011 හා 2012 වර්ෂවල සිට පැවත එන එකතුව රු. 883,015 ක් වූ වෙළඳ ණයගැති ශේෂ හා වසර 05 කට වඩා පැරණි රේඛීය අමාත්‍යාංශයෙන් අයවිය යුතු රු. 34,233 ක ශේෂය අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි.

(ඇ) 2011 වර්ෂයේ සිට වී අලෙවි මණ්ඩලයට ගෙවිය යුතු වියදමක් ලෙස ගිණුම්වල දක්වා ඇති රු. 3,300,000 ක් නිරවුල් කිරීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණ අතර මෙම ශේෂය සනාථ කර ගෙනද නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.13,925,059 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.

1,921,514 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 15,846,573 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී භාණ්ඩාගාර ප්‍රතිපාදන රු. 13,203,909 කින් වැඩි වුවද වෙනත් මෙහෙයුම් ආදායම රු. 21,461,162 කින් අඩුවීම හා සේවක පාරිශ්‍රමික රු. 13,848,268 කින් වැඩිවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂ හතරක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී මූල්‍ය ප්‍රතිඵලයේ ඌනතාවයක් පැවතියද සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය වීම් සැලකිල්ලට ගැනීමේදී 2011 වර්ෂයේදී රු.**23,418,237** ක් වූ දායකත්වය සමාලෝචිත වර්ෂයේදී රු.**27,179,099** ක් දක්වා එනම් සියයට **16** කින් වර්ධනය වී තිබුණි.

### 3.2 මණ්ඩලයට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි

අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව මණ්ඩලයට නීත්‍යානුකූල අයිතියක් නොමැති ඉඩමක 2012 වර්ෂයේදී වැටක් ඉදිකිරීම සඳහා ප්‍රසම්පාදන පරිපාටියෙන් බැහැරව බාහිර පාර්ශවයකට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. එහි වැඩ අවසන් කර තිබුණ ද කොන්ත්‍රාත්කරුට මුදල් නොගෙවීම නිසා රු. 3,209,728 ක වන්දි මුදලක් ලබා ගැනීම සඳහා ඔහු විසින් නීතිඥ ආයතනයක් මගින් මණ්ඩලයට එරෙහිව 2013 දෙසැම්බර් 31 දින එන්තර වාසියක් එවා තිබුණ අතර ඊට අදාල නඩු විභාගය 2016 මැයි 30 දින දක්වාම අවසන් වී නොතිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

(අ) 1973 අංක 15 දරන සාගිනි නිවීමේ ව්‍යාපාර පනත ප්‍රකාරව,

**(i)** සමාජීය හා ආර්ථික සංවර්ධනය සඳහා ආණ්ඩුවේ නොවූ විදේශීය හා දේශීය නියෝජ්‍යත්වවල ආධාර ලබා ගැනීම.

**(ii)** සංවර්ධන යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේදී ආයතනවලට හා වෙනත් මණ්ඩලවලට සහාය වීම.

**(iii)** කෘෂිකාර්මික හා කාර්මික සංවර්ධනයට යොමු වූ යෝජනා ක්‍රමවලට ආධාර කිරීම, දියුණු කිරීම, සම්බන්ධීකරණය කිරීම හා ක්‍රියාත්මක කිරීමෙහිලා ආණ්ඩුවේ නොවූ නියෝජ්‍යත්ව උනන්දු කිරීම .

**(iv)** ජාත්‍යන්තර සාගිනි නිවීමේ ව්‍යාපාර වෙනත් සමාන පිටරට ආයතන සමග සහයෝගී වීම මණ්ඩලයේ අරමුණු වේ.

(ආ) යථෝක්ත අරමුණු ඉටුකර ගැනීම වෙනුවෙන් මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්ම හා එහි ප්‍රගතිය පිළිබඳව සිදුකරන ලද පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

**(i)** ක්‍රියාකාරී සැලැස්මට අනුව දේශීය ආහාර පරිභෝජනය වර්ධනය කිරීම අරමුණු කරගෙන රු. 10,270,000 ක ප්‍රතිපාදන සලසා තිබූ දේශීය ස්වභාවික ආහාර ප්‍රවර්ධන දිස්ත්‍රික් වැඩසටහන හා ග්‍රාමීය වැඩසටහන සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර නොතිබුණි.

(ii) ක්‍රියාකාරී සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂයේදී එකතුව රු. **20,976,000** ක් වැය කර ඉටු කිරීමට සැලසුම් කරන ලද කාර්යයන් 06 ක් වෙනුවෙන් ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් කිසිදු කාර්යයක් ඉටු කිරීමට අපොහොසත් වී තිබුණි.

(iii) ව්‍යාපෘති 11 කින් රු.මිලියන 220 ක ආදායමක් ලැබීමට සැලසුම් කර තිබුණ ද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති 11 කින් උපයා ඇති ආදායම රු. මිලියන 72 ක් පමණක් විය.

(iv) ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් නොවූ ව්‍යාපෘති 2 ක් සඳහා රු.මිලියන 1.4 ක් වැයකර තිබුණි.

**4.2 පාඩු හා හානි**

-------------

මණ්ඩලය විසින් භාවිතා කරනු ලබන මහවැලි අධිකාරියට අයත් වාහනය සමාලෝචිත වර්ෂය තුල අනතුරකට ලක් වීම හේතුවෙන් රු. 133,325 ක පාඩුවක් මණ්ඩලයට සිදුවී තිබුණි.

**4.3 කාර්ය මණ්ඩල පරිපාලනය**

----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලය 28 ක් හා තථ්‍ය කාර්ය මණ්ඩලය 74 ක් වූයෙන් අතිරික්ත සේවක සංඛ්‍යාව 46 ක් විය.

(ආ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව තාවකාලික, අනියම්, ආදේශක හා කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 03 දෙනෙකු බඳවා ගෙන තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

------------------------------------

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

-----------------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුලත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2016 අප්‍රේල් 07 දින එනම් දින 37 ක ප්‍රමාද කාලයකින් පසුවය.

**5.2 අයවැය ලේඛනමය පාලනය**

------------------------------

සමාලෝචිත වර්ෂයේ අයවැය ගත ආදායම් සහ වියදම්, තථ්‍ය ආදායම් සහ වියදම් සමඟ සැසඳීමේදී සියයට 30 සිට සියයට 100 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**5.3 නොවිසඳී ඇති විගණන ඡේද**

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 වර්ෂයේදී ගොවීන් 19 ක් වෙත ගොවිබිම් සඳහා ජලය සැපයීමේ යන්ත්‍ර ලබාගැනීම සඳහා ලබා දෙන ලද රු. 80,610 ක ණය මුදල හා 2011 වර්ෂයේදී හිටපු උප සභාපතිවරයා

විසින් ලබාගෙන තිබූ සුවපෝෂ හා මව්පෝෂ පැකට් වෙනුවෙන් අයවිය යුතු රු. 64,500ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි.

(ආ) මණ්ඩලයේ සංශෝධිත පනත ඉදිරිපත් කරන ලෙස 2012 ඔක්තෝබර් 01 දින පැවැත්වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව නියෝගයක් ලබා දී තිබූ අතර එම නියෝගය ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) 2012 වර්ෂයේදී නාරාහේන්පිට අලෙවිසැලේ සිදු වී තිබූ රු. 77,352 ක මුදල් සොරකම සම්බන්ධයෙන් චෝදනාපත්‍ර කෙටුම්පත හා මූලික විමර්ශන වාර්තා 2015 මැයි 05 දින ලබා දී තිබුණද විගණිත දිනය වූ 2016 ජුනි 08 දින වන විටත් මේ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) මූල්‍ය පරිපාලනය | අයවැයගත වියදම් හා තථ්‍ය වියදම් අතර ප්‍රමාණවත් විචලනයන් අනාවරණය වීම හා ණය නිරවුල් කිරීමට කටයුතු නොකිරීම. |
| (ආ) වත්කම් පරිපාලනය | වාහන විධිමත්ව පවරා නොගැනීම හා විධිමත්ව ලේඛනගත නොකිරීම. |
| (ඇ) කාර්ය මණ්ඩල පරිපාලනය | අතිරික්ත සේවක සංඛ්‍යාව සඳහා අනුමැතිය ලබා නොගැනීම, චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනිව බඳවා ගැනීම. |
| (ඈ) ව්‍යාපෘති කළමනාකරණය | සැලසුම් කළ පරිදි ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම හා ව්‍යාපෘති අලාභ ලැබීම. |